**ගල්නෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015අප්‍රේල් 06 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගල්නෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභා කාර්යාලය සඳහා මිලදී ගෙන තිබුණු වටිනාකම රු.179,800 ක් වූ තිරරෙදි ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබුණු රු.16,695,000 ක්වූ බැකෝ ලෝඩර් යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී හඳුනාගනු ලැබූ රු.65,150 ක් වූ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය
**-----------------------**

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,870,882 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වැඩි ආදායම රු.972,385 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**----------------------**

**2.2.1** **වරිපනම් බදු**

**-------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර එම ප්‍රදේශය තුළ පිහිටියාවූ නිශ්චල දේපල හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පනවා අයකිරීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

**2.2.2** **බදු කුලී**

**--------**

(අ) සභාව සතු වෙළඳ ස්ථාන වාර්ෂිකව බදුදීම මත සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වෙළඳ ස්ථාන 15 කින් එකතුව රු.224,394 ක ටෙන්ඩර් බදු මුදලක් අයවීමට තිබෙන අතර, ඒවායේ හිගහිටි කාලය වර්ෂ 1-14 අතර විය.

(ආ) සභාව සතු කඩකාමර බදුගෙන තිබුණු බදුකරුවන් 16 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවියයුතු රු.149,700 ක්වූ හිඟ කඩකුලී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

**---------------**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙළඳ ස්ථාන 522 කින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.110,575 ක වෙළඳ බලපත්‍ර ආදායමක් අයකර ගැනීමට තිබුණි.

**2.2.4** **උසාවි දඩ**

**------------**

සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාව වෙත අයවිය යුතුව පවතින හිඟහිටි උසාවි දඩ මුදල හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ගිණුම්වල දක්වා තිබුණු රු. 135,384 ක්වූ හිඟහිටි උසාවි දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කරනවා වෙනුවට කිසිදු අනුමැතියකින් තොරව ගිණුම්වලින් ලියාහැර තිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 1-6 ත් අතර කාලයක් තුල සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘතීන් 79 ක් සඳහා එකතුව රු.9,621,878 ක මුදලක් ලැබියයුතුව තිබුණු අතර, අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 01-06 ත් අතර කාලයක් තුල සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘතීන් 132 ක් සඳහා එකතුව රු.10,967,132 ක මුදලක් ගෙවිය යුතුව තිබුණු අතර, අදාල බැරකම් පියවීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) (203 වන අධිකාරය) මෝටර් වාහන පනත 2(1) වගන්තිය ප්‍රකාරව සභාව සතු වටිනාකම රු.1,663,890 ක්වූ ටැෆේ ට්‍රැක්ටර් රථය ලියාපදිංචි කිරීමකින් තොරව දීර්ඝ කාලයක් තිස්සේ ධාවනයේ යොදවා තිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**නිශ්ක්‍රීය වත්කම්**

**--------------------**

සභාව සතු වටිනාකම රු.1,028,640 ක්වූ උපකරණ 24 ක් හා කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය භාවිතයට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ද නිශ්කාර්යයව පැවතුණි.

**04. පද්ධති හා පාලනය**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති/ණයහිමි පාලනය